WORKED. G.

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,584—1958 නොවැම්බර් 14 වැනි සිකුරාද—14.11.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොද ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාගෙන් කරන ප්‍රකාශන ... | — | රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාගෙන් කරන පත් කිරීම් ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 3833 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 3331 | මිළ පාලන දැන්වීම් .... .... .... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 3381 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 3386 |
| වෙනත් පත් කිරීම් ... ... ... | 3382 | " සුරාබදු ආඥාපණත " පිළිබඳ දැන්වීම් — | — |


## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1958 අංක 494**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කරන ලෙස නියම කර ඇත්තේය :—

ඒ. 361/57.

1958 ඔක්තෝබර් මස 8 වැනි දින සිට 1958 ඔක්තෝබර් මස 14 වැනි දින දක්වා, ඊ. සී. ඇස්. පෝල් මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළ කර්මාන්ත හා ධීවර කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වී. ඇස්. ඇම්. ද මැල් මහතා, සවකීය රාජකාරිවලට අතිරේකව, කර්මාන්ත අධ්‍යක්ෂ ධුරයේ වැඩ බැලීමට.

ඒ. 65/57.

1958 ඔක්තෝබර් මස 24 වැනි දින සිට, ආහාර කොමසාරිස් කේ. ඇම්. ඩී. ජයනෙත්ති මහතා (සී.සී.ඇස්.) දිවයිනට පෙරලා පැමිණෙන තුරු, කෘෂිකර්ම හෝ ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් කේ. අල්වාපිල්ලේ මහතා (ඕ.බී.ඊ.), සවකීය රාජකාරිවලට අතිරේකව, ආහාර කොමසාරිස්, ආහාර සැපයීමේ අධ්‍යක්ෂ, ආහාර පාලක සහ මිළ පාලක (ආහාර) වශයෙන් වැඩ බැලීමට.

ඒ. 317/58.

1958 ඔක්තෝබර් මස 12 වැනි දින සිට, දොස්තර ඩබ්ලිව්. ඒ. කරුණාරත්න මහතා නැවත වැඩ භාරගන්නා තුරු, ජ්‍යෙෂ්ඨ සෞඛ්‍ය නිලධාරි (සනීපාරක්ෂක) දොස්තර ඇස්. අමරසිංහ මහතා, සවකීය රාජකාරිවලට අතිරේකව, සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ (මහජන සෞඛ්‍ය සේවා) වශයෙන් වැඩ බැලීමට.

ඒ. 152/56.

1956 අගෝස්තු මස 1 වැනි දින සිට, ඇස්. ඇෆ්. ඇල්. ගුණතිලක සහ ඇල්. සී. අබේසේකර යන මහත්වරු උප පොලිස් සුපිරින්ටැන්ඩන්ට්වරු වශයෙන්.

ඊ. ජී. ගුණවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1958 නොවැම්බර් මස 11 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය.
තැ. පෙ. 500, කොළඹ 1.

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1958 අංක 495**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේය :—

අංකය : ජේජේ. 46/48.

එෆ්. ඊ. ඇලස් මහතා, ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1958 ඔක්තෝබර් 31 වැනි දින, නුවරඑළියේ දිස්ත්‍රික් උසාවියේ අංක 4,068 නඩුවේ තීන්දුව දීමට, නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේජේ. 26/48.

ඒ. ඊ. බුල්ජන්ස් මහතා, ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන්, 1958 නොවැම්බර් 28 වැනි දින පටන් 1958 දෙසැම්බර් 6 වැනි දින දක්වා, කළුතර දිස්ත්‍රික් උසාවියේ අංක 30,255 ; 28,879 ; 31,521 ; 30,618 ; 31,695 හා 30,550 නඩු ඇහීමට, කළුතර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 2/56.

වී. එම්. කුමාරසාමි මහතා, 1958 ඔක්තෝබර් 29 වැනි දින පටන් නැවත නියමයක් කරන තුරු, කෑගල්ලේ මහෙස්ත්‍රාත් ධුරයේ හා රික්වැස්ට් කොමසාරිස් ධුරයේ හා කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයේ වැඩ බැලීමට.

අංකය : ජේජේ. 40/48.

බී. ආර්. ජී. විජේයකෝන් මහතා, 1958 නොවැම්බර් 4 වැනි දින, මාතලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 3,454 නඩුව ඇහීමට හා 1958 නොවැම්බර් 11 වැනි දින, දඹුල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 8,821 නඩුව ඇහීමට, මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා මහනුවර, මාතලේ උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේජේ. 40/48.

එස්. ජේ. බී. ධර්මකීර්ති මහතා, 1958 නොවැම්බර් 18 වැනි දින, මාතලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 3,817 නඩුව ඇහීමට, මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා මහනුවර, මාතලේ උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

3381—ජේ. ඇන්. බී 8606—3,725 (11/58)

අංකය : ජේඑල්. 67ඒ/58.

ඩබ්ලිව්. ඩී. තාමෝදරම් මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ආර්. ද ඉසෙඩ්. ගුණවර්ධන මහතා, 1958 නොවැම්බර් 1 වැනි දින පටන් 3 වැනි දින දක්වා, බලපිටියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 33ඒ/53.

වී. කේ. කන්දසාමි මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, එස්. නටරාජ මහතා, 1958 නොවැම්බර් 6 වැනි දින පටන් 10 වැනි දින දක්වා, අනුරාධපුරයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුරයේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරමේ හා වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ත්‍රිකුණාමලයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 59ඒ/56.

ජී. එම්. එෆ්. සිරිවර්ධන මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ටී. බී. යටවර මහතා, 1958 නොවැම්බර් 3 වැනි හා 6 වැනි දිනයන්හි, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 6සී/52.

වී. එම්. කුමාරසාමි මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එච්. ප්‍රනාන්දු මහතා, 1958 නොවැම්බර් 4වැනි හා 5වැනි දිනයන්හි, කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 7ඒ/51.

ඒ. ඕ. එස්. දිසානායක මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සී. කනගසිංහම් මහතා, 1958 නොවැම්බර් 17 වැනි දින, ත්‍රිකුණාමලයේ අතිරේක නඩුකාර ධුරයට, ත්‍රිකුණාමලයේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා අනුරාධපුරයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේජේ. 1/48.

එස්. නටරාජා මහතා, 1958 නොවැම්බර් 5 වැනි දින, අනුරාධපුරයේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 15,525 නඩුවේ තීන්දුව දීමට, අනුරාධපුරයේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අනුරාධපුරයේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 26/50.

ඒ. ඩී. ජේ. ගුණවර්ධන මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, පී. ජී. ද සිල්වා මහතා, 1958 නොවැම්බර් 4වැනි දින පටන්, අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා අවිස්සාවේල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : පීඑල්/යූ. 2/48.

ජේ. ඩබ්ලිව්. බී. උඩලාගම මහතා නැති අතර, පී.එස්. මහලේකම් මහතා, 1958 නොවැම්බර් 7 වැනි දින, මහනුවර දිස්ත්‍රික්කයේ කුම්පනේ, හරිස් පත්තුවේ පාත හේවාහැට හා උඩ හේවාහැට ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/සී. 5/50.

කේ. වී. ඒ. පෙරේරා මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, ඕ. දල්පද්දු මහතා, 1958 නොවැම්බර් 1 වැනි, 6 වැනි හා 8 වැනි දිනයන්හි, හලාවත දිස්ත්‍රික්කයේ උතුරු හා දකුණු පිටිගල් කෝරළේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පී.එල්/සී. 5/50.

කේ. වී. ඒ. පෙරේරා මහතා නැති අතර, හෝ නැවත නියමයක් කරන තුරු, සී. ජී. එල්. ද අල්විස් මහතා, 1958 ඔක්තෝබර් 31 වැනි දින හා 1958 නොවැම්බර් 4 වැනි දින, හලාවත දිස්ත්‍රික්කයේ උතුරු හා දකුණු පිටිගල් කෝරළේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එෆ්. 1/56.

ඒ. එල්. එම්. ප්‍රනාන්දු මහතා නැති අතර, ඩී. සේරසිංහ මහතා, 1958 නොවැම්බර් 3 වැනි දින, තංගල්ල දිස්ත්‍රික්කයේ බටහිර ගිරුව පත්තුවේ ගම්බද උසාවියේ සභාපති වශයෙන් වැඩ බැලීමට.

එස්. ආර්. විජේතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්

1958 නොවැම්බර් 5 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ.පෙ. අංක 573,
කොළඹ 12.

# වෙනත් පත් කිරීම්

**1958 අංක 496**

ලංකා සිවිල් සේවාවේ පහත සඳහන් පත්වීම් පහත දක්වා ඇති දිනවල පටන් වලංගු වේ :—

අංකය : 74/2/99 (එම්.එෆ්.).

කේ. බී. දිසානායක මහතා, 1958 ඔක්තෝබර් මස 20 වෙනි දින පටන්, කළුතර පාලන දිස්ත්‍රික්කයේ භාර ආණ්ඩුවේ ඒජන්ත තැනගේ විධානය පිට එකී දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත තැන වශයෙන් කටයුතු කිරීමට.

අංකය : 74/48 (එම්.එෆ්).

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු මහතා, 1958 ඔක්තෝබර් මස 23 වෙනි දින පටන්, මහා භාණ්ඩාගාරයේ සේවයෙහි යෙදීමට.

එල්. එස්. පෙරේරා මහතා, 1958 ඔක්තෝබර් මස 23 වෙනි දින පටන්, මහා භාණ්ඩාරයේ සේවයෙහි යෙදීමට.

එෆ්. සී. පීටර්ස් මහතා, 1958 ඔක්තෝබර් මස 23වෙනි දින පටන්, මහා භාණ්ඩාගාරයේ සේවයෙහි යෙදීමට.

ආර්. ජී. ජී. ඕ. ගුණසේකර මහතා, 1958 ඔක්තෝබර් මස 23 වෙනි දින පටන්, මහා භාණ්ඩාගාරයේ සේවයෙහි යෙදීමට.

ඒ. ආර්. එම්. ජයවර්ධන මහතා, 1958 ඔක්තෝබර් මස 23 වෙනි දින පටන්, මහා භාණ්ඩාගාරයේ සේවයෙහි යෙදීමට

වී. සී. බී. උනන්තැන්න මහතා, 1958 ඔක්තෝබර් මස 23 වෙනි දින පටන්, මහා භාණ්ඩාගාරයේ සේවයෙහි යෙදීමට.

එස්. එෆ්. අමරසිංහ,
භාණ්ඩාගාරයේ ලේකම්.

1958 නොවැම්බර් මස 3 වෙනි දින,
මුදල් අමාත්‍යාංශය, කොළඹ 1.

---

**1958 අංක 497**

අංකය : අයිඑන්ක්‍යු/එල්/12/7/57.

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 16 වෙනි පරිච්ඡේදයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

1958 ඔක්තෝබර් මස 30 වෙනි දින සිට, ආර්. බී. රණතුංග මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ බින්තැන්න පත්තුවේ ප්‍රාදේශීය ආදායම් පාලක ධුරයෙහි වැඩබලන කාලය තුළ එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට එක්ස්. එම්. සෙල්ලතම්බු මහතාද,

1958 ඔක්තෝබර් මස 30 වෙනි දින සිට, ඩබ්ලිව්. එම්. ඒ. විජේරත්න බණ්ඩා මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ වැව්ගම් පත්තුවේ ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි ධුරයෙහි වැඩබලන කාලය තුළ එම පත්තුවේ හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට එච්. එම්. සභානායක මහතාද,

1958 ඔක්තෝබර් මස 31 වෙනි දින සිට, රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළේ පල්ලේ පත්තුවේ අතිරේක හදිසි මරණ පරීක්ෂක ධුරයට ඩී. ටී. ආර්. පියදාස මාදොල මහතාද,

1958 නොවැම්බර් මස 6 වෙනි දින සිට, ජේ. එම්. සභාරත්නම් මහතා නැවත වැඩ භාරගන්නා තුරු, මඩකලපු දිස්ත්‍රික්කයේ කරවාකු සහ නින්ටවූර් පත්තුවල ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි ධුරයෙහි වැඩබලන කාලය තුළ එම පත්තුවල හදිසි මරණ පරීක්ෂක ධුරයෙහි වැඩබැලීමට ආර්. සිත්තම්පරපිල්ලේ මහතාද

පත්කර ඇත්තේය.

ජී. සී. ටී. ඒ. ද. සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන ස්ථිර ලේකම්.

1958, නොවැම්බර් මස 11 වෙනි දින,
අධිකරණ අමාත්‍යාංශය, කොළඹ.

---

**1958 අංක 498**

සිරිල් ප්‍රංචි බණ්ඩා ගුණතිලක මහතා, ගම්පල අධිකරණ කොට්ඨාශය ඇතුළත, ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් පත්කර තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1958 ඔක්තෝබර් මස 29 වැනි දින,
කොළඹදිය.

# ආණ්ඩුවේ නිවේදන

## 1946 අංක 37 දරණ කිරුම් හා මිනුම් ආඥපනත

### 29 වැනි වගන්තිය යටතේ නියෝගය

වාණිජ හා වෙළෙඳ ඇමති තැන්පත් රිචඩ් ගෝඨාභය සේනානායක වන මම, 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ආඥාවෙන් මඳක් වෙනස් කර ඇති 1946 අංක 37 දරණ කිරුම් හා මිනුම් ආඥපනතේ 29 වැනි වගන්තියෙන් මට පවරා ඇති බලතල ප්‍රකාර, මේ නියෝගයෙන් 1959 පෙබරවාරි 15 වැනි දින හා එදිනට පසු මෙහි උපලේඛනයේ දක්වෙන එක් එක් ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගේ කොට්ඨාශයන්ගේ ද, වසම්වලද, නගර සභාවේද පාලනයට සීමාවූ ප්‍රදේශ තුළ කිසිම වෙළෙඳාමක් සඳහා 1955 අප්‍රියෙල් 22 වැනි දින අංක 10,787 දරණ ගැසට් අතිරේකයේ පළවූ 1955 කිරුම් හා මිනුම් රෙගුලාසිවල පළමුවැනි උපලේඛනයේ II වැනි කොටසේ ඒ සඳහා නියමකර ඇති හරිවැරදි බැලීමේ සලකුණෙන් පරීක්ෂකවරයකු විසින් මුද්‍රා තබා නැති කිසිම තරාදි පඩියක්, සේරුවක් හෝ කිරීමේ හෝ මැනීමේ උපකරණයක් පාවිච්චි කිරීම තහනම් කරමි.

ආර්. ජී. සේනානායක,
වාණිජ හා වෙළඳ ඇමති.

1958 ඔක්තෝබර් 30 දින,
කොළඹදීය.

### උපලේඛනය

#### ප්‍රාදේශීය ආදායම් නිලධාරීන්ගේ කොට්ඨාශ

මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළය,
මාතර දිස්ත්‍රික්කයේ කන්දබඩ පත්තුව,
කෑගලු දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළය,
කෑගලු දිස්ත්‍රික්කයේ දෙහිගම්පල් හා පහල බුලත්ගම කෝරළ,
රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළය,
මහනුවර දිස්ත්‍රික්කයේ උඩ පළාත කොට්ඨාශය,
මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තු කොට්ඨාශය,
මහනුවර දිස්ත්‍රික්කයේ කඩවත් කොට්ඨාශය,
මහනුවර දිස්ත්‍රික්කයේ පාත හේවාහැට කොට්ඨාශය,
මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර හා යටිනුවර කොට්ඨාශය,
මහනුවර දිස්ත්‍රික්කයේ පහත දුම්බර කොට්ඨාශය,
මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ කොට්ඨාශය,
මහනුවර දිස්ත්‍රික්කයේ උඩ දුම්බර කොට්ඨාශය,
අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවරගම් පළාත,
අනුරාධපුර දිස්ත්‍රික්කයේ හුරුළු පළාත.

#### වසම්

කෑගලු දිස්ත්‍රික්කයේ අලුත්ගම් හා පනාවල කෝරළ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තුමාගේ කොට්ඨාශයේ අල්ගොඩ, තල්දූව, මාගම්මන දෙරණියගල, මහර, පට්බේරිය සහ පනාවල වසම්.

#### නගර සභාව

නාවලපිටිය.

---

## සමිති සමාගම් ආඥපනත

වාණිජ හා වෙළඳ ඇමති තැන්පත් රිචඩ් ගෝඨාභය සේනානායක වන මම, 1947 සැප්තැම්බර් 24 වැනි දින අංක 9,773 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශයෙන් මඳක් වෙනස් කර ඇති සමිති සමාගම් ආඥපනතේ (105 වැනි පරිච්ඡේදය) 3 (බී) දරණ වගන්තියෙන් මට පවරා ඇති බලතල ප්‍රකාර මේ නිවේදනයෙන්, '' සීමාසහිත කතිරේසන් විද්‍යාලීය අධ්‍යාපනික සමිතිය '' නමින් හැඳින්වෙන සමිතිය පිහිටුවීමේ අභිප්‍රාව 1954 අගෝස්තු 13 වැනි දින අංක 10,703 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් සමිති සමාගම් ආඥපනතේ (105 වැනි පරිච්ඡේදය) බලතල හා පහසුකම් හිමිකර ඇති අභිප්‍රාවක් ලෙස බලය පවරමි.

ආර්. ජී. සේනානායක,
වාණිජ හා වෙළඳ ඇමති.

1958 ඔක්තෝබර් 29 වැනි දින,
කොළඹ දීය.

---

## 4 ඒ පෝර්මය

### 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පනත

#### පනතේ දහවැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ වැඩබලන කොමසාරිස් තැන්පත් වික්ටර් ජෝශප් හැරල්ඩ් ගුණසේකර වන මා, 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පනතේ දහවැනි වගන්තිය යටතේ දැනුම් දී සිටින්නේ පහත සඳහන් උපලේඛනයේ දක්වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම එකී පනතේ 4 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ අනුමතකිරීමට යම්කිසි මහජනයෙකුගේ විරුද්ධතාවයක් ඇත්නම්, කුමන කාරණා නිසා එවැනි විරුද්ධතාවය මුල්කරගනු ලැබීද යනු සඳහන් ලිපියක් මෙම දැන්වීම ප්‍රසිද්ධකළ දින සිට මාසයක් තුළදී නොලැබුනි නම් ඒ සෑම ඉල්ලුම් පත්‍රයක්ම අනුමත කරන බවයි.

විරුද්ධවන සෑම අයකුගේ සම්පූර්ණ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල සෑම විරුද්ධවීමේ නිවේදනයකම ඇතුළත්විය යුතුයි.

වී. ජේ. එච්. ගුණසේකර,
ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ
වැඩ බලන කොමසාරිස්තැන.

කොළඹ, 1958වූ නොවැම්බර් මස 11 වෙනි දින දීය.

### උපලේඛනය

| ඉල්ලුම්පත්‍රයෙහි නොම්මරය සහ දිනය | | ලංකාවේ පුරවැසියෙකු වශයෙන් ලියාපදිංචිකිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල |
|---|---|---|
| C 5942—1.8.51 | ... | ජෙරෝම් ඉග්නේසියුස් ජෝකිම්, 17, යුනිටි පෙදෙස, ඉනර් ප්ලවර් පාර, කොළඹ-3 |
| J 1964—3.7.51 | ... | අලගිරිසාමි තන්ගයියා, මිඩ්ෆෝඩ් වත්ත, හැටන් |
| J 4748—22.7.51 | ... | මුත්තුසාමි නල්ලතම්බි, බ්‍රවුන්ලෝ වත්ත, මස්කෙළිය |
| J 8340—27.7.51 | ... | ක්‍රිෂ්නප්පන් නාරායනසාමි, ඉහළ කොටස, නෝර්වුඩ් වත්ත, නෝර්වුඩ් |
| K 2515—13.2.51 | ... | ආරුමුගම් රාමයියා නොහොත් අලගන්, දික්ඔය වත්ත, දික්ඔය |

---

## 4 බී පෝර්මය

### 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පනත

#### පනතේ දහවැනි වගන්තිය යටතේ දැන්වීමයි

ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ වැඩබලන කොමසාරිස් තැන්පත් වික්ටර් ජෝශප් හැරල්ඩ් ගුණසේකර වන මා, 1949 නො. 3 දරණ ඉන්දියානු සහ පාකිස්තානි නිවැසි (පුරවැසි) පනතේ දහවැනි වගන්තිය යටතේ දැනුම් දී සිටින්නේ පහත සඳහන් උපලේඛනයේ දක්වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම එකී පනතේ 4 වැනි වගන්තියේ 1 වැනි සහ 2 වැනි උප වගන්ති යටතේ අනුමතකිරීමට යම්කිසි මහජනයෙකුගේ විරුද්ධතාවයක් ඇත්නම් කුමන කාරණා නිසා එවැනි විරුද්ධතාවය මුල්කරගනු ලැබීද යනු සඳහන් ලිපියක් මෙම දැන්වීම ප්‍රසිද්ධකළ දින සිට මසක් තුළදී නොලැබුනි නම් ඒ සෑම ඉල්ලුම් පත්‍රයක්ම අනුමතකරන බවයි.

විරුද්ධවන සෑම අයෙකුගේම සම්පූර්ණ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල සෑම විරුද්ධවීමේ නිවේදනයකම ඇතුළත්විය යුතුයි.

වී. ජේ. එච්. ගුණසේකර,
ඉන්දියානු සහ පාකිස්තානි වාසීන් ලියාපදිංචිකිරීමේ
වැඩබලන කොමසාරිස්තැන.

කොළඹ, 1958වූ නොවැම්බර් මස 11 වෙනි දිනදීය.

## උපලේඛනය

| ඉල්ලුම්පත්‍රයෙහි නො. සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචිකිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචිකිරීමට ඉල්ලුම්කරන අයගේ නමත් සමග ලියාපදිංචිකිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| J 1202—20.2.51 | ... කන්දසාමි රාමලිංගම්, ලක්ෂපාන වත්ත, මස්කෙළිය ... | පුෂ්පම්මා (භාර්‍යාව), ගෝමස් අන්තෝනි (පුතා), ඉග්නාසියුස් ඉරුදයම් (පුතා), ජෝන් තම්බිරාජා (පුතා). |
| J 1223—20.2.51 | ... කන්දයියා මානික්කම්මා, අංක 74, කෙළින් වීථිය, හැටන් ... | වේළුසාමි (පුතා) |
| J 1315—20.2.51 | ... කුප්පන් පරසුරාමන්, ලක්ෂපාන වත්ත, මස්කෙළිය ... | මීනාච්චි (භාර්‍යාව), මුත්තු නොහොත් මුනියන්ඩි නොහොත් මුනුසාමි (පුතා), පොන්නයියා නොහොත් පොන්නන් (පුතා), මුනිඅම්මා (දුව), පොන්නම්මා (දුව), සිවපෙරුමාල් (පුතා), |
| J 1330—20.2.51 | ... මුත්තු සින්නයියා, ලක්ෂපාන වත්ත, මස්කෙළිය ... | රෙන්ගම්මා (භාර්‍යාව), සීරන්ගායි නොහොත් රෙන්ගම්මා (දුව), පෙරුමාල් (පුතා), පෝජන් (පුතා), මුනියන්ඩි (පුතා) |
| J 1354—24.2.51 | ... වීරසාමි ක්‍රිෂ්නසාමිගේ වැන්දඹුවවූ උන්නම්මා, සාන්ත ඇන්ඩෲ කොටස, ලක්ෂපාන වතුයාය, මස්කෙළිය | සුප්පයියා නොහොත් සුප්පන් (පුතා), විසාලාච්චි (දුව), රෙන්ගරාජ් (පුතා), සෙල්ලම්මා (දුව) |
| J 1585—29.5.51 | ... රෙන්ගසාමි කුප්පුසාමි, යූ.ඩී.කේ., වෙලේඔය වත්ත, හැටන් | සින්නම්මා (භාර්‍යාව), මුනිඅම්මා (දුව), මුනිසාමි (පුතා), සුබ්‍රමානියන් නොහොත් කුමාරස්වාමි (පුතා), සෙල්වදුරෙයි (පුතා), රාමචන්ද්‍රන් (පුතා) |
| J 1810—20.5.51 | ... මානික්කම් ආරුමුගම්, ඩැනෝටාර් කොටස, බ්‍රන්ස්වික් වතුයාය, මස්කෙළිය | වල්ලි අම්මෙයි (භාර්‍යාව), වාමදේවන් නොහොත් රාමදේවන් (පුතා), නවමනි (දුව) |
| J 1847—20.5.51 | ... රාමන් සින්නසාමි, ඩැනෝටාර් කොටස, බ්‍රන්ස්වික් වතුයාය, මස්කෙළිය | පේතායි (භාර්‍යාව), ලෙච්චුමී (දුව) |
| J 2024—17.6.51 | ... ආනෙයි කුට්ටි සීරෙන්ගන්, ගාට්මෝර් කොටස, ගාට්මෝර් වතුයාය, මස්කෙළිය | මුත්තම්මා (භාර්‍යාව) |
| J 2322—20.5.51 | ... වේලයිදම් තන්ගයියා, ගහවත්ත වත්ත, මස්කෙළිය ... | කනගම්මා (භාර්‍යාව), පොන්නයියා නොහොත් සිවනු (පුතා), කිට්නම්මා (දුව), නඩරාජා නොහොත් සෙල්ලයියා (පුතා), මාරියායි (දුව), කන්දවේල් නොහොත් සුබ්‍රමානියන් (පුතා), පරමේස්වරී (දුව) |
| J 2701—25.3.51 | ... කරුප්පන්නන් මරුදපිල්ලෙයි පලනියන්ඩි, පෝට්‍රී වත්ත, නෝර්වුඩ් | ක්‍රිෂ්නම්මා (භාර්‍යාව), දේවසගායම් (පුතා) |
| J 2724—25.3.51 | ... සෙන්ගයපිල්ලෙයි සිදම්බරම්පිල්ලෙයි, කැළණිය වත්ත, මස්කෙළිය | කාමාච්චි අම්මාල් (භාර්‍යාව) |
| J 2761—17.1.51 | ... මුත්තුසාමි රාජී, පහළ කොටස, මෝකා වත්ත, මස්කෙළිය | මුනිඅම්මාල් (භාර්‍යාව), කමළම් නොහොත් වල්ලි අම්මා (දුව), තන්ගවේළු (පුතා), තෙයිවානෙයි නොහොත් තෙයිඹිමා (දුව), පෙරුමාල් නොහොත් තන්ගයියා (පුතා), මුත්තුසාමි (පුතා), අම්මවාසි (පුතා) |
| J 2765—17.1.51 | ... අයියසාමි අයියසාමි, ඉහළ කොටස, මෝකාවත්ත, මස්කෙළිය | ලෙච්චුමි (භාර්‍යාව), සිවගාමු නොහොත් කාමාච්චි (දුව), පුන්ගාවනම් (දුව), අයියාවු (පුතා), පාප්පු නොහොත් තෙසිවානෙයි (දුව), සෙල්වරාජ් (පුතා), ෂන්මුගනාදන් (පුතා) |
| J 2800—17.1.51 | ... කදිර්වේල් රාමසාමි, ඉහළ කොටස, මෝකා වත්ත, මස්කෙළිය | නල්ලම්මා (භාර්‍යාව), කදිරි (දුව), තිම්මායි නොහොත් රාමායි (දුව), පාප්පම්මා (දුව), අන්නලෙච්චුමි (දුව), වෙල්ලයන් (පුතා) |
| J 2807—17.1.51 | ... කිරුෂ්නන් කනපති, ඉහළ කොටස, මෝකා වත්ත, මස්කෙළිය | පොන්නම්මා (භාර්‍යාව), රාමචන්තිරම් නොහොත් සුබ්‍රමානියන් (පුතා), කනගම්මා (දුව), යෝගම්මා (දුව), රාමචන්ද්‍රන් (පුතා) |
| J 2946—17.1.51 | ... පොන්නයියා රෙන්ගනාදන්, ඉහළ කොටස, මෝකාවත්ත, මස්කෙළිය | ලෙච්චුමී (භාර්‍යාව) |
| J 3423—18.5.51 | ... වේලයිදම් මාරිමුත්තු, මින්න කොටස, ස්ත්‍රැත්ස්පි වතුයාය, අප්කොට් | සේවායි (භාර්‍යාව), වේළුසාමි (පුතා) |
| J 3762—12.7.51 | ... සින්ගිරි බෝරා, පී. ඩබ්ලිව්. ඩී. ලැයිම, නෝර්වුඩ් ... | මනිඅම්මාල් (භාර්‍යාව), සිවලිංගම් නොහොත් සිවානන්ද මූර්ති (පුතා), ලෙච්චිමී (දුව) |
| J 4081—18.6.51 | ... ඉරුසන් මරුදමුත්තු, බනියන් වත්ත, මස්කෙළිය ... | සෙල්ලම්මා (භාර්‍යාව), අයියම්මා (දුව), සුබ්‍රමානියම් (පුතා), මරුදයි (දුව), වීරායි (දුව) |
| J 4257—18.7.51 | ... පූවයියා විනෝදමනි, බ්‍රන්ස්වික් වතුයාය, මස්කෙළිය ... | නල්ලම්මාල් (භාර්‍යාව), ජෝජ් ඥානබාලන් (පුතා) කිංස්ලි එම්මානුවෙල් ඥානයියා (පුතා), ප්ලෝරන්ස් ඥානසෙල්වම් (දුව), හෙන්රි ජාකොබ් (පුතා), එබනේසර් විළියම් (පුතා) |
| J 4287—15.7.51 | ... පලනියන්ඩි වයිදි, ග්ලෙන්ගරිස් වත්ත, නෝටන්බ්‍රිජ් ... | කරුප්පායි (භාර්‍යාව), සෙල්ලායි (දුව), කුප්පායි නොහොත් කුප්පම්මා (දුව), පාර්වතී (දුව) |
| J 4373—15.7.51 | ... අරුනාචලම් ආන්ඩි, අංක 55, කෙළින් වීථිය, නෝර්වුඩ් ... | පාප්පු (භාර්‍යාව), පුෂ්පරාජු (පුතා), සෙල්වරානි (දුව) |
| J 4562—21.7.51 | ... කන්දසාමි සින්නසාමි, ඇන්. ආර්. ඇම්. ඒ. පී. ආර්. පෙරිය කරුප්පන් චෙට්ටියාර් මහතා බාරේ, නෝර්වුඩ් | සීනි අම්මාල් (භාර්‍යාව), වේලම්මාල් නොහොත් පලනියායි (දුව), ගනේෂ් (පුතා), සිවලිංගම් නොහොත් කනගරත්නම් (පුතා), කන්දසාමි නොහොත් කන්දයියා (පුතා), රාජේස්වරී (දුව), බාලසරස්වතී (දුව) |

| ඉල්ලුම්පත්‍රයෙහි නො. සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචිකිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචිකිරීමට ඉල්ලුම්කරන අයගේ නමත් සමග ලියාපදිංචිකිරීමට අයැද සිටින අන්‍ය අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| J 4581—22.7.51 | … මාරිමුත්තු රාමයියා, "තුන්ගරාජා වලවු", මන්නාරම පාර, වයිරවාර් පුලියන්කුලම්, වවුනියා | මාරියායි (භාර්යාව), පිච්චපුල්ලෙයි (දුව), ලෙච්චුමී (දුව), බාලක්‍රිෂ්නසාමි නොහොත් බාලක්‍රිෂ්නන් (පුතා), ගෝවින්දසාමි (පුතා) |
| J 4597—14.7.51 | … ආරෝක්කියම් වීරයියා, පහළ කොටස, නෝර්වුඩ් වත්ත, නෝර්වුඩ් | සේදු (භාර්යාව) |
| J 4676—22.7.51 | … මාරිමුත්තු මුරුගයියා, කැළණිය සහ බ්‍රෙමාර් වත්ත, මස්කෙළිය | අන්ගම්මා (භාර්යාව), සුප්පම්මා නොහොත් සුබ්බු ලෙච්චුමී (දුව), තන්ගරාජා නොහොත් අරුනාචලම් (පුතා), සුප්පුලෙච්චුමී නොහොත් රත්නම් (දුව), ජෙයරාමන් (පුතා), මුත්තුලෙච්චිමී (දුව) |
| J 5394—27.7.51 | … රෙන්ගන් ආරුමුගම්, අග්‍රඔය වත්ත, රොසැල්ල … | මීනාච්චි (භාර්යාව), සිවභාමි නොහොත් නල්ලම්මා (දුව), සාරසු නොහොත් නල්ලායි (දුව), කමලාදේවි (දුව) |
| J 5464—29.7.51 | … මරුදමුත්තු වඩිවේල්, බාර්ගනි කොටස, ෆේයාර්ලෝන් වතුයාය, අප්කොට් | සිවනායි (භාර්යාව), පලනියායි (දුව), පලනියන්ඩි (පුතා), මරුදයි (දුව), සෙල්ලන් (පුතා) |
| J 6386—8.7.51 | … කරුප්පන් කාලිමුත්තුගේ වැන්දඹුව වූ අලගම්මා, මෝරේ කොටස, මෝරේ වතුයාය, මස්කෙළිය | කරුප්පන් නොහොත් සෙල්ලමුත්තු (පුතා), මාරියායි (දුව), සිවනු (පුතා), සෙල්ලමුත්තු (පුතා), පෙරියක්කා (දුව), සිවපාකියම් (දුව) |
| J 6745—30.7.51 | … මුත්තුකරුප්පන්ගේ පුතා අයියන් නොහොත් අයියන්කුට්ටි, ගහවත්ත කොටස, බ්‍රවුන්ලෝ වතුයාය, මස්කෙළිය | සිවනායි (සෝයුරී) |
| J 6750—30.7.51 | … වේලයිදන් මුත්තන්, ගහවත්ත කොටස, බ්‍රවුන්ලෝ වතුයාය, මස්කෙළිය | පුන්ජෝලෙයි (භාර්යාව), වේලායි (දුව), නල්ලම්මා (දුව), මාරියායි (දුව), සුබ්‍රමානියම් (පුතා), කන්දසාමි (පුතා), වේලන් නොහොත් වේලයුදන් (පුතා), මුරුගන් (පුතා) |
| J 7095—27.7.51 | … මුනියන්ඩි පකිරි, නෝර්වුඩ් වත්ත, නෝර්වුඩ් … | රාක්කු (භාර්යාව), කරුප්පයියා (පුතා), මුනියන්ඩි (පුතා) |
| J 7169—27.7.51 | … පෙරුමාල් කරුප්පයියා, පහළ කොටස, නෝර්වුඩ්වත්ත, නෝර්වුඩ් | පාකියම් (භාර්යාව) |
| J 7185—27.7.51 | … සෙල්ලමුත්තු අයියකන්නු, රොක්වුඩ් වත්ත, නෝර්වුඩ් … | අම්මාච්චි (භාර්යාව) |
| J 8605—31.7.51 | … මුත්තුසාමි වේළු, මිඩ්ලෝතියන් වත්ත, මස්කෙළිය … | වීරායි (භාර්යාව), ලෙච්චුමන් (පුතා), ඥානම් (පුතා) |
| J 8626—1.8.51 | … කරුප්පන්නන් ඔඩයාර්, බ්‍රවුන්ලෝ වත්ත, මස්කෙළිය … | කරුප්පායි (භාර්යාව), ජෙයරාජ් (පුතා), තියාගරාජා (පුතා), ජෙයලෙච්චුමී නොහොත් කමළාදේවි (දුව), සරවනමුත්තු (පුතා), කාලිමුත්තු (පුතා), රාජාලෙච්චුමී (දුව) |
| J 9280—28.7.51 | … සෙල්ලමුත්තු සින්නයියා, අග්‍රඔය වත්ත, රොසැල්ල … | කාලිඅම්මා (භාර්යාව), නඩරාජා නොහොත් මෙයියප්පන් (පුතා), සෙල්ලතුරෙයි නොහොත් සෙල්ලයියා (පුතා), සෝතිඅම්මාල් (දුව), වල්ලිමයිල් (පුතා), සිවනාදන් (පුතා), සිවඥානම් (දුව), වාමදේවන් (පුතා) |
| J 9644—1.8.51 | … රාමසාමි වෙන්ගඩාසලම් නඩරාජා පිල්ලෙයි, අංක 80, කෙළින් වීථිය, වටවල | සෙල්ලම්මා (භාර්යාව), රාමසාමි (පුතා), තනපාකියම් (දුව), විජයලෙච්චුමී (දුව), විමලාදේවි (දුව) |
| J 9646—18.2.51 | … පෙරියන්න පිල්ලෙයි නඩරාජා නොහොත් නඩේසන්, කැළණියවත්ත, මස්කෙළිය | රාජම්බාල් (භාර්යාව), සේතුරානි (දුව), මුත්තුකුමාර් (පුතා) |
| J 9930—4.8.51 | … සිදම්බරම් සෙල්ලපිල්ලෙයි, කිව් වත්ත, නෝර්වුඩ් … | මාරියායි (භාර්යාව), පෙරියසාමි (පුතා), විජයලෙච්චුමී (දුව), මහේස්වරි (දුව) |
| J 10613—4.8.51 | … අන්තෝනි ආරොකියම්, ග්ලෙන්කෝන් වත්ත, දික්ඔය … | සින්න මාරිඅම්මා (භාර්යාව) |
| J 10662—15.5.51 | … මුත්තන් මුත්තුසාමි, ගහවත්ත වත්ත, මස්කෙළිය … | සෙල්ලම්මා (භාර්යාව), මුත්තුසාමි (පුතා) |
| J 10827—4.8.51 | … ජෙගනාදන් මුනුසාමි, ඉහළ කොටස, කිව් වත්ත, නෝර්වුඩ්… | සුදමනි (භාර්යාව), විජයලෙච්චුමී (දුව) |
| J 10938—31.7.51 | … අන්තෝනිමුත්තු සෝමාලෙයි, අංක 65, කෙළින් වීථිය, නෝර්වුඩ් | නායගම් (භාර්යාව), ඉන්නාසිඅම්මාල් (දුව), සෙබස්තියන් (පුතා), මයිකල් (පුතා), ජේසුමාරි (දුව), අම්බ්‍රෝස් (පුතා), රෙජීනමාරි (දුව) |
| J 10982—5.8.51 | … වෙන්ගඩාසලම් රාමසාමි, අංක 35, කෙළින් වීථිය, නෝර්වුඩ් | සියලම්මා (භාර්යාව), වල්ලිඅම්මා (දුව), කාමාච්චි (දුව), පෙරියසාමි (පුතා) |
| K 20—25.9.50 | … පාකියම් අන්තුනමරියානුස්, කැම්පියන් වතුයාය, බගවන්තලාව | මේරි අන්තෝනි තෙරේසා (භාර්යාව), ලිලීමේරි (දුව), ජෝන් පාකියම් (පුතා), මේරි ලුසියා (දුව) |
| K 450—4.10.50 | … ඉන්නාසිමුත්තු ආරෝකියම්, ඉහළ කොටස, කොටිගල වත්ත, බගවන්තලාව | ආරෝකියම්මාල් (භාර්යාව), ජෙබමාලෙයි (පුතා), නායගම් (දුව), පාකියම් (දුව) |
| K 631—4.10.50 | … සදයන් සුබ්‍රමානියන්, කොටියගල වත්ත, බගවන්තලාව … | පෙරුමායි (භාර්යාව), සේල්වරාසී (පුතා), සෙල්වමලර් (දුව) |
| K 1000—30.10.50 | … පලනියන්ඩි වීරප්පන්, පහළ කොටස, කොටියගල වත්ත, බගවන්තලාව | කාමාච්චි (භාර්යාව), පලනියායි නොහොත් පලනිඅම්මාල් (දුව), රාමචන්ද්‍රන් නොහොත් පාවන් (පුතා), තනම් නොහොත් තනපාකියම් (දුව), සෙල්ලායි නොහොත් විසාලාච්චි (දුව) |
| K 1133—27.11.50 | … පලනිඅප්පන් වල්ලිලිංගම්, දරවෙල වත්ත, දික්ඔය … | මාරියායි (භාර්යාව), මීනාච්චි (දුව) |
| K 1245—10.12.50 | … සෙන්ගන් මනිවේල්, හැඩිලි වත්ත, දික්ඔය … | සෙල්ලම්මා (භාර්යාව), රාමජෙයම් (පුතා), තන්ගම්මා (දුව) |
| K 1344—10.12.50 | … වෙල්ලයන් තේවරාජ්, හැඩිලි වත්ත, දික්ඔය … | අමුර්දම් (භාර්යාව) |
| K 3324—19.6.51 | … අන්නෙයිමුත්තු අරුනාසලම්, අංක 8 කන්ඩායම, සී.ජී.ආර්., හැටන් | පෙරියඅම්මා නොහොත් පෙරිය පොම්මා (භාර්යාව), සුබ්‍රමානියම් (පුතා) |
| K 3963—10.2.51 | … අබ්දුල් අතමෂ්, පහළ කොටස, කර්කස්වෝල්ඩ් වත්ත, බගවන්තලාව | මාරියම්මාල් (භාර්යාව), අවයම්මා නොහොත් කුළුසාම්බි (දුව), පාතම්මා නොහොත් කතීසා (දුව) |

| ඉල්ලුම්පත්‍රයෙහි නො. සහ දිනය | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචිකිරීමට අයැද සිටින ඉල්ලුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල | ලංකා පුරවැසියෙකු ලෙස ලියාපදිංචිකිරීමට ඉල්ලුම්කරන අයගේ නමත් සමග ලියාපදිංචිකිරීමට අයැද සිටින අනාා අයකුගේ නම සහ ඉල්ලුම්කරුට ඇති සම්බන්ධකම |
|---|---|---|
| K 4263—11.7.51 | ... මාදවන් කේසාවන්, ඇල්බැද්ද වත්ත, බගවන්තලාව | ... මදලමාරි නොහොත් මදලිඅම්මා නොහොත් මදලම්මාල් (භාර්යාව), දේවදසන් (පුතා), පිළොමිණම්මාල් (දුව), තෙරේසා (දුව), සෙල්වනායගි (දුව), ජෝශප් රාජ රත්නම් (පුතා), කරුණාකරදස් (පුතා) |
| K 5243—6.5.51 | ... සුප්පන් සින්නප්පන්, කාස්ල්රී වත්ත, දික්ඔය | ... සින්න කොලන්දෙයි (භාර්යාව), ආරුමුගම් (පුතා) අරුචුනන් (පුතා), දෙරෙයිසාමි (පුතා), තෙයිවානෙයි නොහොත් පාර්වතී (දුව), සුබ්‍රමානියන් (පුතා) |
| K 6833—25.3.51 | ... සෙවන්දලිංගම් ආන්ඩි, හෝන්සී වත්ත, දික්ඔය | ... පච්චයම්මාල් නොහොත් පච්චම්මා (භාර්යාව), පෙරිය සාමි නොහොත් මුත්තුකරුප්පන් (පුතා), සෙල්ලම ලෙයි නොහොත් සෙල්ලම්මාල් නොහොත් කාමාච්චි (දුව), තලිමන් (පුතා), සෙවෙන්තිලිංගම් (පුතා), අම්මාසී (පුතා), තන්ගා (දුව), තනපාලන් (පුතා) |
| K 6961—1.7.51 | ... පිච්චමුත්තු සුප්පයියා, පහළ කොටස, ඇල්බැද්ද වත්ත, බගවන්තලාව | මරියායි (භාර්යාව), සරස්වති නොහොත් සරෝජා (දුව), බාලකිට්නන් (පුතා), තනලෙච්චුමි නොහොත් පර මේස්පරි (දුව), පුෂ්පසීලම් නොහොත් ලලිතා (දුව), වයිතිලිංගම් (පුතා), තේවමනි (දුව) |
| J 8879—31.7.51 | ... අරුලාන්දු ඥානමුත්තු, පෝට්‍රි වත්ත, නෝර්වුඩ් | ... අන්නම්මාල් (භාර්යාව), ජෙවමාලෙයි (දුව), අරුලප්පන් නොහොත් ප්‍රනාන්දු (පුතා), සවෙරිඅම්මා නොහොන් මාරිඅම්මා (දුව), ප්‍රනාන්දු නොහොත් අරුලප්පන් (පුතා), සූසෙයි (පුතා), ජෝශප් (පුතා), අන්නමාරි නොහොත් අන්නම්මා (දුව), මාරිඅම්මාල් (දුව) |

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මාතලේ දිස්ත්‍රික්කයේ තුවක්කු බලපත්‍ර 1959 අවුරුද්ද සඳහා අළුත් කිරීම

මාතලේ දිස්ත්‍රික්කයේ රිවෝල්වර්, පිස්තෝල සහ රයිෆල් බලපත්‍ර හැර අනිත් තුවක්කු බලපත්‍ර 1959 අවුරුද්ද සඳහා අළුත්කිරීම ඒ ඒ කොට්ඨාශවල ප්‍රාදේශීය ආදයම් නිලධාරී තුමන් විසින් 1958 දෙසැම්බර් 1 වැනි දින පටන් කරනු ලබන බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. රිවෝල්වර්, පිස්තෝල සහ රයිෆල් බලපත්‍ර අළුත් කිරීම මාතලේ කච්චේරියේදී ඉහත සඳහන් දින පටන් කරනු ලැබේ.

2. තුවක්කු සඳහා දී ඇති සෑම බලපත්‍රයක්ම දෙසැම්බර් 31 වෙනිදට පෙර 1959 අවුරුද්ද සඳහා අළුත්කර ගන්නා ලෙස අවවාද වශයෙන් දන්වනු ලැබේ. බලපත්‍ර අළුත් කිරීමේදී පරණ බලපත්‍රයද සෝදිසි කිරීම පිණිස එම තුවක්කුවද ඒ ඒ නිලධාරි වෙත ඉදිරිපත් කළ යුතුය.

3. යමෙකු 1958 දෙසැම්බර් 31 වෙනිදට ප්‍රථම බලපත්‍ර අළුත් කර නොගන්නෙහි නම්, එවැනි බලපත්‍රයක් නියමිත කාලයෙන් පසුව අළුත් කිරීමේදී බලපත්‍ර ගාස්තු මුදලින් රු.100ක අතිරේක දඩ මුදලක් ගෙවා අළුත් කර ගන්නට සිදුවේ. යම් කිසි හේතුවක් නිසා බලපත්‍රයක් අළුත් කර නොගන්නෙහිනම්, එම බලපත්‍රයද තුවක්කුවද බලපත්‍ර නිකුත්කරන නිලධාරි වෙත 1958 දෙසැම්බර් 31 වෙනි දින හෝ ඊට පෙර භාර දිය යුතුයි.

4. 1958 වර්ෂයට නිකුත් කරණ ලද තුවක්කු බලපත්‍රයක් බලපත්‍ර නිකුත්කරන නිලධාරි තුමාට භාරදීම පිණිස යමෙකු ළඟ නැත්නම්, එවැනි බලපත්‍රයක සහතික පිටපතක් සඳහා නියමිත බලපත්‍ර ගාස්තුවට තවත් වැඩිපුර රුපියලක්ද ගෙවන්නට සිදුවේ.

5. 1959 මාර්තු 31 වැනි දිනට ප්‍රථම තුවක්කු බලපත්‍ර අළුත්කර නොගන්නා අයට විරුද්ධව නඩු පවරන බවද සැලකිය යුතුයි.

වී. පී. ඒ. පෙරේරා,
ආණ්ඩුවේ ඒජන්ත සහ බලපත්‍ර
නිකුත් කිරීමට බලය ලත් නිලධාරි තැන.

1958 නොවැම්බර් 8 වැනි දින,
කච්චේරිය, මාතලේ.

---

## 1959 වර්ෂය තුවක්කු බලපත්‍ර අළුත් කිරීම—ගාලු දිස්ත්‍රික්කය

තුවක්කු හිමියන් විසින්, 1958 දෙසැම්බර් 1 වැනි දින සිට 1958 දෙසැම්බර් 31 වැනි දින දක්වා, තමන්ගේ තුවක්කු බලපත්‍ර 1959 වර්ෂයට අළුත් කර ගත යුතු බැව් මෙයින් නිවේදනය කරමි. තුවක්කු බලපත්‍ර අළුත් කිරීම සඳහා තුවක්කු බලපත්‍ර හිමියන් තමන්ගේ ප්‍රදේශය කරවන ආදයම් නිලධාරි තැන වෙත 1958වේ වර්ෂයට නිකුත් කරන ලද බලපත්‍රයත්, බලපත්‍ර ගාස්තුත් ඉදිරිපත් කළ යුතුයි. 1958 වර්ෂයට නිකුත් කරන ලද බලපත්‍රය නොමැති නම්, තුවක්කු බලපත්‍රය නැතිවීමේ සහතිකය සඳහා වැඩිපුර රුපියල් 1ක් ගෙවිය යුතුයි. 1958 දෙසැම්බර් 31 වැනි දින හෝ ඊට ප්‍රථම තම බලපත්‍ර අළුත් කර නොගන්නා බලපත්‍ර හිමියන්ට, බලපත්‍රය සඳහා අය කරන මුදලට සමාන මුදලක් දඩ වශයෙන් ගෙවීමට සිදුවේ. 1959 මාර්තු 31 වැනි දින දක්වා, දඩ මුදල අය කර බලපත්‍ර අළුත් කිරීම, ප්‍රාදේශීය ආදයම් නිළ ධාරීන් විසින් කර ගෙන යනු ලැබේ. ඉන්පසු බලපත්‍ර අළුත් කිරීම කරනු ලබන්නේ කච්චේරියේ දීය. 1959 මාර්තු 31 වැනි දින හෝ ඊට ප්‍රථම තුවක්කු බලපත්‍ර අළුත් කර නොගන්නා බලපත්‍ර හිමියන්ට විරුද්ධව නීති මාර්ගයෙන් කටයුතු කරනු ලැබේ. තුවක්කු බලපත්‍ර ගාස්තු වශයෙන් මුද්දර භාර ගනු නොලැබේ.

යම් තුවක්කුවක් ක්‍රියා විරහිතව ඇත්නම්, එය 1958 බලපත්‍රයත් සමඟ කච්චේරියට හෝ බලපත්‍ර හිමියා වසන ප්‍රදේශය කරවන ආදායම් නිළධාරි තැන වෙත හෝ භාර දිය යුතුයි. එසේ නො කළහොත්, නියමිත ගාස්තු ගෙවා 1959 වර්ෂය සඳහාත් බලපත්‍රයක් ගැනීමට සිදුවෙනවා ඇත.

සියලුම තුවක්කු, පිස්තෝල හා රිවොල්වර හිමියන් බලපත්‍ර අළුත් කිරීමේදී තමන්ගේ තුවක්කු පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළ යුතුයි.

දිසාපති කාර්යාලය,
ගාල්ල.

සී. ජේ. සේරසිංහ,
ගාලු දිස්ත්‍රික්කයේ දිසාපති තැන.

---

## 1959 වර්ෂය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ තුවක්කු බලපත්‍ර අලුත්වැඩියා කිරීම

1959 වර්ෂය සඳහා තුවක්කු බලපත්‍ර අලුත්වැඩියා කිරීම 1958 වර්ෂයේ නොවැම්බර් මස 15 වෙනි දින සිට පටන් ගනු ලැබේ. එබැවින් 1958 ක්වූ දෙසැම්බර් 31 වෙනි දිනට ප්‍රථමයෙන් ලැයිසන් කරුවන් පදිංචි ප්‍රදේශය භාර ආදයම් පාලක නිලධාරිතුමන්ගේ කාර්යාල වලින් අලුත්වැඩියා කර ගත යුතුයි. ප්‍රදේශ භාර ආදයම් පාලක නිලධාරිතුමන්ලාගේ ලිපිනයන් පහත දැක්වේ:—

(අ) වැළඩ විල්ලි හත්පත්තුවේ ආදයම් පාලක නිලධාරිතුමා, දඹුලු පාර, කුරුණෑගල.

(ආ) හිරියාල හත්පත්තුවේ ආදයම් පාලක නිලධාරිතුමා, ඉබ්බාගමුව.

(ඉ) දේවමැදි හත්පත්තුවේ ආදයම් පාලක නිලධාරිතුමා, වාරියපොල.

(ඊ) දඹදෙණි හත්පත්තුවේ ආදයම් පාලක නිලධාරිතුමා, දෙනගමුව පාර, ගොඩවෙල, පොල්ගහවෙල.

(උ) කටුගම්පොල හත්පත්තුවේ ආදයම් පාලක නිලධාරිතුමා, කුලියාපිටිය.

(ඌ) වන්නි හත්පත්තුවේ ආදයම් පාලක නිලධාරිතුමා, දලදගම, මහව.

2. තුවක්කු බලපත්‍ර අලුත්වැඩියා කිරීම සඳහා මුද්දර භාරගනු නොලැබේ. දෙසැම්බර් 31 වෙනි දට පෙර බලපත්‍රයක් නැති වුනි නම් රුපියලක් ගෙවා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතුමාගෙන් පිටපතක් ලබා ගත යුතුයි. 1958 බලපත්‍රය හෝ එහි පිටපත ඉදිරිපත් නොකළ අයට අලුත් බලපත්‍රයක් නිකුත් කරනු නොලැබේ. සියලුම බලපත්‍ර කරුවන් හැකිතාක් ඉක්මණින් බලපත්‍ර අලුත්වැඩියා කර ගත යුතුයි. 1958 දෙසැම්බර් 31 වෙනි දට ප්‍රථමයෙන් නව වර්ෂය සඳහා අලුත් බලපත්‍රයක් නොගත් අයට බලපත්‍රයේ ගාස්තුවට සමාන දඩ මුදලකට යටත් වීමට සිදුවේ. 1959 මාර්තු 31 වෙනි දින දක්වා ප්‍රදේශ භාර ආදයම් පාලක නිලධාරීන් විසින් ඉහතකී

දඩ මුදල අය කර බලපත්‍ර අලුත් වැඩියා කරනු ලැබේ. මේ කාලය තුලදී බලපත්‍ර අලුත්වැඩියා කිරීම කුරුණෑගල කච්චේරියේදී නොකරනු ලැබේ. තවද, 1959 මාර්තු 31 වෙනිදට ප්‍රථමයෙන් බලපත්‍ර අලුත්වැඩියා නොකළ අයට නීති මාර්ගයෙන් දඩුවම් පමුණුවනු ලැබේ.

3. බලපත්‍ර අලුත් කිරීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රවල සඳහන් සෑම තුවක්කුවක්ම එම බලපත්‍ර අලුත් කිරීමට මා විසින් බලය දෙන ලද නිලධාරිතැන වෙත බලපත්‍රය නිකුත් කිරීමට පෙර පරීක්ෂණය පිණිස ඉදිරිපත් කළ යුතු බවද, මෙයින් මහජනයා වෙත දනුම් දෙමි.

4. යම් තුවක්කුවක් පාවිච්චි නොකළ හැකි තත්ත්වයක තිබේ නම් 1958 වර්ෂයට නිකුත් කර තිබෙන වලංගු බලපත්‍රයත් සමඟ පළාතේ ගම්මුලාදැනි තැනට හෝ ආදායම් පාලක නිලධාරිතැනට හෝ කුරුණෑගල කච්චේරියට, 1958 දෙසැම්බර් 31 වෙනිදට ප්‍රථමයෙන් භාර දිය යුතුයි. ගම්මුලාදැනියාට භාර දුනි නම්, ඔහුගෙන් එය ලැබුනු බවට රිසිට් පතක් ලබා ගත යුතුයි. එසේ එය භාර නොදුන්නොත් 1959 වර්ෂය සඳහා ගෙවිය යුතු ගාස්තුව ගෙවා බලපත්‍රය අලුත්වැඩියා කර තුවක්කුව භාරදීමට සිදුවේ.

ඒ. ඇල්. පෙරේරා,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතුමා.

1958 ක්වූ නොවැම්බර් මස 7 වෙනි දින,
කුරුණෑගල කච්චේරියේදීය.

---

## ''හෙමරජික් සෙප්ටිසීමියා'' නමැති භයානක රෝගය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙනි හත්පත්තුවේ බටගිර ඕතොට කෝරළයේ උඩපොල පළාතේ ගවයින් අතර ''හෙමරජික් සෙප්ටිසීමියා'' නැමැති රෝගය පැතිරී යන බැවි බෝවන රෝග සම්බන්ධ ආඥපනතේ 327 වැනි පරිච්ඡෙදයේ 4 වෙනි වගන්තියේ 1 වෙනි අතුරු වගන්තියේ යටතේ බෝවන රෝග ඇති පළාත් ලෙස මා විසින් වර්ෂ 1958ක්වූ අගෝස්තු මස 8 වෙනි දින නො. 11,471 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙන් ප්‍රසිද්ධ කරන ලද දන්වීම අද දින සිට අවලංගු වන බව මෙයින් මහජනයා වෙත දන්වමි.

ඒ. ඇල්. පෙරේරා,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහ දිසාපති තුමා.

කච්චේරිය,
කුරුණෑගල, 29.10.1958.

---

## ''හෙමරෙජික් සෙප්ටිසීමියා රෝගය''

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ ආදයම් නිලධාරි කොට්ඨාශයේ මීගහහේන ගමෙහි ගවයන් අතර ''හෙමරෙජික් සෙප්ටිසීමියා'' නමැති භයානක රෝගය පැතිරී යන බවට, 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවන රෝග පිළිබඳ (සංශොධිත) ආඥ පණතේ 327 වැනි පරිච්ඡෙදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ බෝවන රෝග ඇති පළාතක් ලෙස මා විසින් වර්ෂ 1958ක්වූ සැප්තැම්බර් මස 5 වැනි දින අංක 11,516 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද දන්වීම අද දින සිට අවලංගු වන බව මෙයින් මහ ජනයා වෙත දන්වමි.

ආයුර්වේදස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1958ක්වූ නොවැම්බර් මස 6 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරිතැනගේ
කායර්‍යාලයේදීය.

---

## ''හෙමරෙජික් සෙප්ටිසීමියා රෝගය''

වයඹ පළාතේ හලාවත පිටිගල් කෝරලේ ආදයම් නිලධාරි කොට්ඨාශයේ ආදිප්පොල වසම, බින්ගදෙණිය වසම සහ නල්ලදරන්කට්ටුව යන ගම් මුලාදැනි වසම් වල ගම්වල ''හෙමරෙජික් සෙප්ටිසීමියා'' නමැති භයානක රෝගය පැතිරී යන බැවි 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවන රෝග පිළිබඳ (සංශොධිත) ආඥ පණතේ 327 වැනි පරිච්ඡෙදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තියේ ප්‍රකාර මා විසින් බෝවන රෝග ඇති පළාතක් ලෙස වර්ෂ 1958 ක්වූ අගෝස්තු මස 22 වැනි දින අංක 11,479 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද දන්වීම අද දින සිට අවලංගු වන බව මෙයින් මහ ජනයා වෙත දන්වමි.

ආයුර්වේදස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1958ක්වූ නොවැම්බර් 6 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරිතැනගේ
කායර්‍යාලයේදීය.

## ප්‍රකාශනයයි

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ උතුරු මාතලේ ආදයම් නිලධාරි කොට්ඨාශයේ කන්දලම, පල්ලේගම සහ ඉනාමළුව යන ගම්මුළාදැනි වසම්වල ගම්වල ගවයන් අතර ''හෙමරෙජික් සෙප්ටිසීමියා'' නමැති රෝගය පැතිරී යන බැවින් රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආයුර්වේදස අමරසිංහ වන මම සතුන්ගේ බෝවන රෝග සම්බන්ධ ආඥ පණතේ 327 වැනි පරිච්ඡෙදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය සහ 1957 අංක 33 දරණ පණතේ සංශොධනය යටතේ මට පැවරී තිබෙන බල තල අනුව පහත සඳහන් සීමා ඇළතුත පිහිටි ප්‍රදේශය බෝවන රෝග ඇති ප්‍රදේශයක් ලෙස සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :

උතුරට : අවුදන්ගාව සහ පළුතැව වසම්,

දකුණට : මීරිස්ගෝනි ඔය සහ ඇරැවුල වසම,

නැගෙනහිරට : කන්දලත් කන්ද,

බස්නාහිරට : මීරිස්ගෝනි ඔය සහ අනුරාධපුර දිස්ත්‍රික් මායිම.

2. මෙම ආඥ පණතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද ''සතුන්ගේ බෝවන රෝග'' පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීතියානුකූලව ක්‍රියා කරන අයුරු, ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර මාතලේ පශු වෛද්‍ය තැනගෙන් හෝ නාවුල, උතුරු මාතලේ කරවන ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කායර්‍යාලයෙන් ලබා ගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු බව දත යුතුයි.

ආයුර්වේදස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1958ක්වූ නොවැම්බර් මස 6 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැනගේ
කායර්‍යාලයේ දීය.

---

## ප්‍රකාශනයයි

වයඹ පලාතේ පුත්තලම් දිස්ත්‍රික්කයේ ආනමඩුව ආදයම් නිලධාරි කොට්ඨාශයේ කරඹෑව පත්තුවේ මෙරුන්ගොඩ, කරඹෑව සහ අලන්කුලම යන ගම්මුලාදැනි වසම් වල ගම්වල ගවයන් අතර ''හෙමරෙජික් සෙප්ටිසීමියා'' නමැති රෝගය පැතිරී යන බැවින් රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආයුර්වේදස අමරසිංහ වන මම සතුන්ගේ බෝවන රෝග සම්බන්ධ ආඥපනතේ 327 වැනි පරිච්ඡෙදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය සහ 1957 අංක 33 දරණ පනතේ සංශොධනය යටතේ මට පැවරී තිබෙන බල තල අනුව පහත සඳහන් සීමා ඇතුලත පිහිටි ප්‍රදේශය බෝවන රෝග ඇති ප්‍රදේශයක් ලෙස සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : මී ඔය,

දකුණට : කොතලකෙමියාව පලාත,

නැගෙනහිරට : කොයිලන්දෙගම පලාත,

බස්නාහිරට : වන්නි හත් පත්තුව.

2. මෙම ආඥපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද ඉහත සඳහන් සීමා ඇතුලත පිහිටි ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනා ලද වාහන හෝ මෙම දන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද ''සතුන්ගේ බෝවන රෝග'' පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීතයානුකූලව ක්‍රියා කරන අයුරු, ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර පුත්තලමේ පශු වෛද්‍ය තැනගෙන් හෝ ආනමඩුවේ, ආනමඩුව ප්‍රදේශය කරවන ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කායර්‍යාලයෙන් ලබා ගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු බව දත යුතුයි.

ආයුර්වේදස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1958 ක්වූ නොවැම්බර් මස 6 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැනගේ
කායර්‍යාලයේ දීය,

## ප්‍රකාශනයයි

උතුරු මැද පලාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවරගම් පලාත ආදයම් නිලධාරි කොට්ඨාශයේ අංක 17 දරණ තුලානේ ගම්වල ගවයන් අතර "හෙමරෙජික් ෙසප්ටිසීමියා" නමැති රෝගය පැතිරී යන බැවින් රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආයසීදස අමරසිංහ වන මම, සතුන්ගේ බෝවන රෝග සම්බන්ධ ආඥපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය සහ 1957 අංක 33 දරණ පනතේ සංශෝධනය යටතේ මට පැවරී තිබෙන බල තල අනුව පහත සඳහන් සීමා ඇතුලත පිහිටි ප්‍රදේශය බෝවන රෝග ඇති ප්‍රදේශයක් ලෙස සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : ගල්කඩවල,

දකුණට : පරණ හල්මිල්ලෑව,

නැගෙනහිරට : අළුත් හල්මිල්ලෑව,

බස්නාහිරට : තිඹිරි වැව.

2. මෙම ආඥපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද ඉහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනා ලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදෙශයක ඒ ඒ නිලධාරීන් විසින් නීතියානුකූලව ක්‍රියා කරන අයුරු, ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර කුරුන්දන්කුළමෙ පශු වෛද්‍ය තැනගෙන් හෝ අනුරාධපුරයේ නැගෙනහිර නුවරගම් පලාත කරවන ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කායාීලයෙන් ලබා ගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු බව දත යුතුයි.

ආයසීදස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1958ක්වූ නොවැම්බර් මස 6 වැනි දින,
ඉපේරාදෙණියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැනගේ
කායසීාලයේ දීය.

## ප්‍රකාශනයයි

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ කලාගම් පළාත ආදයම් නිලධාරි තොට්ඨාශයේ උතුරු කලාගම් කෝරළයේ කලාවැව ගමෙහි ගවයන් අතර "හෙමරෙජික් සෙප්ටිසීමියා" නමැති රෝගය පැතිරී යන බැවින් රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආයසීදස අමරසිංහ වන මම, සතුන්ගේ බෝවන රෝග සම්බන්ධ ආඥ පනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය සහ 1957 අංක 33 දරණ පනතේ සංශෝධනය යටතේ මට පැවරී තිබෙන බල තල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවන රෝග ඇති ප්‍රදේශයක් ලෙස සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි :—

උතුරට : පුලියන්කුලම,

දකුණට : අවුකන,

නැගෙනහිරට : කලා වැව,

බස්නාහිරට : ඊච්චන්කුළම.

2. මෙම ආඥ පනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීතියානුකූලව ක්‍රියා කරන අයුරු, ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර කැකිරාව පශු වෛද්‍ය තැනගෙන් හෝ ඒ ඒ පළාත් කරවන ප්‍රාදේශීය ආදයම නිලධාරි තැනගේ කායසීාලයෙන් ලබා ගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු බව දත යුතුයි.

ආයසීදස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1958 ක්වූ නොවැම්බර් මස 6 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැනගේ
කායසීාලයේ දීය.

## විශෙෂ නිවේදනයයි

1958 නොවැම්බර් 25 වැනි අඟහරුවාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1958 නොවැම්බර් 28 වැනි දින නිකුත්කරනු ලබන ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1958 නොවැම්බර් 24 වැනි සඳුද පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1958 නොවැම්බර් 11 දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.